# දේශීය නිෂ්පාදනවලින් අවශ්‍ය තරම් සත්වාහාර

මෙරට සත්ව පාලනය සංවර්ධනය කිරීමට සෑම ජාතික සංවර්ධන සැලැස්මකම විශේෂ අවධානයක් යොමු කර තිබුණා. එසේ වුනත් එහි දී එම වැඩ සටහන්වල සමහරක් අසාර්ථක වීම්වලට ප්‍රධාන වශයෙන් තුඩු දුන්නේ සත්වාහාර හිඟයයි. මනා තත්වයකින් යුතු නොවීමත්, පහසුවෙන් ලබා ගැනීමට නොතිබීමත් සහ ඒවායේ ඉහළ මිලත් කුකුළන්, ඌරන් හා කිරි පට්ටි කරුවන් ගේ කටයුතු ලාභදායී නොවන තත්වයට හෙළීම සිදු වී ඇත.

මේ තත්වයෙන් පෙන්වා දෙන්නේ ඉහළ ම තාක්‍ෂණික තත්වයන්, සත්ව පාලන විශේෂඥ සේවා, මිනිස් ශ්‍රමය හා භූමි සම්පත් කෙතරම් ප්‍රශස්ථ ලෙස ප්‍රයෝජන කර ගත්තත් සත්ව පාලනයෙහි යෙදෙන්නන්ට අවශ්‍ය සත්වාහාර ප්‍රමාණවත් පරිදි සම්පාදනය කෙරෙන වැඩ සටහනකින් තොර වන්නේ නම් ඒ සැලැස්ම වල්වල සාර්ථකත්වයක් බලාපොරොත්තු විය නොහැකි බව යි.

## සත්වාහාරවල අවශ්‍යතාව

දැනට සැලසුම් කර තිබෙන නව කෘෂි කාර්මික සංවර්ධන යෝජනාවලියේ දිගු කාලීන සැලැස්මට අනුව ඉදිරි වසර 20 අවසානයේ දී මෙරටට සත්වාහාර ටොන් 2,00,000 ක් වත් අවශ්‍ය වනවා ඇත. කෙටි කාලීන සැලැස්මවලට අනුව 1982 වන විට අවශ්‍ය වන සත්වාහාර ප්‍රමාණය ටොන් 1,60,000 කැයි ගණනය කර ඇත. මෙයින් 50% ක් කුකුළන් හා ඌරන් පාලනය සඳහාත් ඉතිරි 50% කිරි පට්ටි පාලනය සඳහාත් අවශ්‍ය යැයි සැලකේ. දැනට මෙරට නිෂ්පාදනය කෙරෙන්නේ ටොන් 74,000 ක් පමණකි.

## පුන්නක්කු නිෂ්පාදනය

බොහෝ කාලයක් මෙරට ගවයින්ට දුන් ප්‍රධාන සාන්ද්‍ර ආහාරය වූයේ පොල් හා තල් පුන්නක්කු යි. පුන්නක්කුවල අඩංගු ද මෙසේ කොටස් කර දැක්විය හැකි යි.

| | | |
|---|---|---|
| ජලය | .. | 11·4 |
| ඛණිජ ද්‍රව්‍ය | .. | 4·5 |
| ඊදර් රසය | .. | 8·0 |
| රළු ප්‍රෝටීන් | .. | 21·2 |
| රළු කෙදි | .. | 11·5 |
| නයිට්‍රජන් වලින් තොර රසය | | 42·4 |
| | | 100·0 |

කිරි පට්ටි ව්‍යාපාරය පුළුල් කිරීමත් සමඟම මෙරට වෙළඳ පොලේ පුන්නක්කු ටොන් එකක මිළ රු. 400.00 සිට රු. 2400.00 දක්වා ඉහළ ගියෙන් කිරි පට්ටි කරුවනට උග්‍ර ප්‍රශ්නයකට මුහුණ පෑමට සිදු විණි. සාන්ද්‍ර ආහාරවලට පදනම වන පුන්නක්කුවල මිළ සාධාරණ තත්වයකට පහත හෙළීමට දැන් පියවර ගනිමින් ඇත. මෙහි ප්‍රධාන මාර්ගයක් වන්නේ පොල් වගාවේ මනා සංවර්ධනයක් ඇති කරලීම යි. පොල් වගා ප්‍රදේශවල පස සාරවත් බව රැකීමට අවශ්‍ය කටයුතු කිරීමත්, සත්ව හා බෝග වගාවලින් සංයුක්ත වූ ගොවිතැන් රටාවකට වගාකරුවන් ඇබ්බැහි කිරීමත් (මෙමගින් පොල් එලදාව සියයට 200 ක් වැඩි කර ගත හැකි යයි සඳහන් ය) සහ පෛන්ද්‍රිය පෝර යෙදීමෙනුත් පොල් නිෂ්පාදනය පුනරුත්තාපනය කිරීමෙන් පුන්නක්කු නිෂ්පාදනය වසරකට ටොන් 45,000 සිට ටොන් 80,000 දක්වා වැඩි කළ හැකි වේ යයි අපේක්‍ෂා කරනු ලැබේ.

## නිවුඩු හා අනිකුත් සහල් ශේෂ

අප රට සත්ව පාලන සංවර්ධන වැඩ පිළිවෙළ සලකා බලන විට සහල් සැකසීමෙහි දී නිෂ්පාදනය කෙරෙන නිවුඩු සහ අනිකුත් සහල් ශේෂ සත්වාහාර වශයෙන් සකස් කර ගැනීමට තරම් විශාල වුත්, ප්‍රමාණවත් වුත් උනන්දුවක් නොදක්වේ. දැනට මෙරට ඇති 300 ක් පමණ වූ වී මෝල් වලින් වැඩි හරියක් "හලර්" ක්‍රමයේ ඒවා වන අතර, මෙම යන්ත්‍ර මගින් පාහින වී වලින් සත්වාහාර වශයෙන් ලැබෙන ශේෂ උසස් තත්වයක් නොගනී.

මේ නිසා "කෝන්" ක්‍රමයේ වී පාහින යන්ත්‍ර මෝල් හිමියන්ට ලබා දෙන්නේ නම් මැනවැයි අදහස් කෙරේ.

සහල් සැකසීමේ දී ලබා ගන්නා නිවුඩු හා අනිකුත් ශේෂ සහල්වල වැදගත් ම අතුරු නිෂ්පාදනය යි. දනට එසේ සකසන ශේෂවල 20% ක් පමණ ඇත්තේ දහයියා ය. මෙය සතුටුදායක නොවන අතර, එම ප්‍රමාණය 10–15% දක්වා අඩු කර ගත යුතුව ඇත. මෙසේ සකස් කර ගන්නා සහල් නිවුඩුවල විටමින් බී වර්ග යහමින් ඇති අතර (සහල් නිවුඩු) තෙල් 14–18% ප්‍රමාණයක් ද ඇතුළත්ය. මේ තෙල් පෙරා ගැනීමට හැකි නම් සත්වාහාර වශයෙන් සහල් නිවුඩු වල තත්වය වැඩි දියුණු වන අතර, ඒවා කල් තබා ගැනීමේ තත්වය ද වැඩි දියුණු වේ. එබඳු සහල් නිවුඩු ගව ආහාර සැකසීමේ දී 40% දක්වා ද, ඌරන්ට දෙන ආහාරවල 30-40% දක්වා ද, කුකුළු ආහාරවල 25% දක්වා ද අඩංගු කළ හැකිය.

දනට මෙරට අක්කර දශ ලක්ෂ 1·4 ක පමණ වී වගා කරන අතර, එය අනාගතයේ මහවැලිය බඳු විශාල ජල සම්පත් සංවර්ධන යෝජනා ක්‍රම හේතු කොට ගෙන ඉහළ යමින් පවතී. ඉදිරි අවුරුදු හයක කාලය තුළ රටේ වී වගා කරන ප්‍රමාණය අක්කර දශ ලක්ෂ 2·00 දක්වා ඉහළ යන හෙයින්ද. මෙයින් 50% ක ප්‍රමාණයක් යල කන්නයේ ද වගා කෙරේ යැයි සලකන විටද වී නිවුඩු නිෂ්පාදනය සඳහා දිවයින පුරා ව්‍යාප්ත වැඩ සටහනක් දියත් කිරීමෙන් වසරකට සහල් නිවුඩු හා ශේෂ ටොන් 2,50,000 ක් ලබා ගත හැකි යැයි ඇස්තමේන්තු කර ඇත.

## අනිකුත් දේශීය සම්පත්

රටේ සත්වාහාර නිෂ්පාදනය වැඩි කිරීමේ වැදගත්කම සලකා ඒ සඳහා උපයෝගි කර ගත හැකි අනිකුත් දේශීය සම්පත් සම්බන්ධව ද සොයා බැලීම වැදගත්ය.

## රබර් ඇට මද

මෙරට රබර් වගා කෙරෙන ඉඩම් ප්‍රමාණය අක්කර 560,000 කි. රබර් ඇටවල මදයෙහි ප්‍රෝටීන් බහුලව ඇත. එහි අඩංගු ද පිළිබඳ විස්තරයක් මෙසේය.

රබර් ඇටයෙහි කටුව ඉවත් කර මදය මිරිකා තෙල් ගැනීමට දන් විද්‍යාඥයින් යන්ත්‍ර නිපදවා තිබේ. මේ අන්දමින් ඉතුරු වන මද ශේෂය සත්වාහාර උදෙසා කදිම ය. මේ අනුව පුළුල් වැඩ පිළිවෙලක් සකස් කෙරෙන්නේ නම් වසරකට සත්වාහාර උදෙසා රබර් මද ටොන් 8 500 ක් පමණ ලබා ගත හැකි යයි සැලකේ.

## පළතුරු ශේෂ

පළතුරු කර්මාන්ත ශාලාවලින් ඉවත ලන පළතුරු ශේෂය සත්වාහාර සකස් කිරීම උදෙසා කදිම යයි සැලකේ. දනට දිවයිනේ තිබෙන මෙබඳු කර්මාන්ත ශාලාවලින් වසරකට පළතුරු ශේෂ ටොන් 750 ක් පමණ ඉවත දමයි. මෙසේ අපතේ යන ද ප්‍රයෝජනවත් දෙයක් බවට හරවා ගැන්ම රටට හිතකර වන්නේ වෙයි.

## උක් දඬු හා උක්ගස් දළු

සීනි කර්මාන්ත ශාලාවලින් යුෂ මිරිකා හළ උක් දඬු හා කපා ගන්නා උක් ගස්වල දල්ල සත්වාහාර සකසා ගැනීම උදෙසා යොද ගත හැකියි. දනට අප රට ඇති උක් පදනම් කර ගත් කර්මාන්ත වලින් වසරකට යුෂ මිරිකා හළ උක් ශේෂ ටොන් 1,000-1,500 දක්වා ලබා ගත හැකිය. මෙයට අමතරව උක් ගස් දළු වියලා සත්වාහාරයකට සකස් කර ගැනීමෙන් ටොන් 22,000 ක් වසරකට නිෂ්පාදනය කළ හැකි වේ යැයි දනට වගා කොට ඇති ප්‍රමාණය අනුව ඇස්තමේන්තු කොට තිබේ.

## තණ ආහාර

බොහෝ කිරි පට්ටිකරුවනට විශේෂයෙන් මැදරට, උඩරට හා නගරාසන්නව සිටින අයට ඔවුන් ගේ කිරි පට්ටිවල ඇති කරන උසස් වර්ගයේ එළදෙනුනට ප්‍රමාණවත් පෝෂ්‍යදයී වැඩි දියුණු තණ වගා කර කපා දීමට තරම් ඉඩම් ප්‍රමාණයක් ඔවුන් සතුව නොමැත. මේ නිසා ඔවුන් තණ කොළ බොහෝ විට ලබා ගන්නේ පාරවල්වල දෙපසින්, රජයේ ඉඩම් වලින් හා පිටතින් මිළ දී ගැනීමෙනුත් ය. කෙසේ වුවද, මේ අන්දමින් ලබා ගන්නා

තෘණ පෝෂ්‍යදායී බව අතින් හීන අතර, සාමාන්‍යයෙන් දිනකට කිරි පයින්ට් 10 ක් නිපදවන රාත්තල් 800 ක් පමණ බර එළදෙනක නඩත්තුවට තරම් ප්‍රමාණවත් නොවේ. මේ තත්වය කිරි පට්ටිකරුවන් සාන්ද්‍ර ආහාර මතම රැඳීමට හේතු වේ. බොහෝ අවස්ථාවල ගනු ලබන කිරි පයින්ට් එකකට රාත්තල් 1/2 1 දක්වා වූ ප්‍රමාණයක් සාන්ද්‍ර ආහාර දෙනු ලැබේ. උසස් වර්ගවල පෝෂ්‍යදායී තෘණ හා ඉපිල් ඉපිල් බඳු රනිල බෝග වගාව ද ගව ආහාර උදෙසා වගා කිරීම දිවයිනේ ව්‍යාප්ත කිරීම මැනවි. සාමාන්‍යයෙන් දිනකට ගැළුම් 1.5 සිට 2.00 දක්වා නිෂ්පාදනය කෙරෙන එළදෙකට 70% දක්වා තෘණ ද, 30% ක් වියළි තත්වයෙන් ඉපිල් ඉපිල් කොළ සහ හොඳ ඛණිජ මිශ්‍රණයක් සහ ධාන්‍ය මිශ්‍රනයක් ද සමඟ ආහාරයට දෙනු ලබන්නේ නම් අවශ්‍ය පෝෂණය එයින් ලබා දිය හැකි යයි සත්ව පාලන විද්‍යාඥයින් ගේ විශ්වාසය යි.

### පිදුරු හා දහයියා

ඉදිරි පස් වසර තුළ මෙරට මහ කන්නය අක්කර දශ ලක්ෂ 2 ක් ද, යලට අක්කර දශ ලක්ෂයක් ද, කුඹුරු වගා කෙරෙන්නේ නම් වසරකට පිදුරු ටොන් දශ ලක්ෂ 2 ක් ද, වී කෙටීමේ දී දහයියා ටොන් 6,75,000 ක් ද, නිපදවන්නේ යැයි දළ වශයෙන් ඇස්තමේන්තු කර ඇත.

කෙසේ වුව ද' පිදුරු මෙන් ම දහයියා වලින් ද සත්වාහාර හැටියට සකස් කර ගත යුතුව ඇත්තේ විශේෂ රසායනික ක්‍රම උපයෝගී කර ගෙන යි. ඊට හේතුව ඒවා රළු කෙඳි වැඩි පෝෂ්‍යදයකත්වයෙන් හීන වූ ද්‍රව්‍ය බැවිනි. ඇත්ත වශයෙන් ම ඇමරිකා එක්සත් ජනපදයේ පවා පිදුරු වලින් මනා පෝෂ්‍ය-දයකත්වයක් ඇති ගව ආහාරයක් සකස් කර ගැනීම පිළිබඳ පර්යේෂණ තවමත් අවසන් වී නොමැත. දහයියා ගැන පර්යේෂන කර ඇති ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ බී. ඕ. ගව් විද්‍යාඥයින් පීඩන තත්වයන් යටතේ ඇමෝනියා උපයෝගී කර ගෙන දහයියාවල සිලිකා ඉවත් කර ඊට කැල්සියම් පොස්පේට් එකතු කර වමාරා කන සත්වයින්ට ආහාරයක් හැටියට සකස්කර ගැනීමට කටයුතු කිරීම පිළිබඳව සාර්ථක වූ පර්යේෂණ අවසන් කර තිබේ.